

# සුනාමි නිවාස ව්‍යාපෘතියට මුල්ගල් තබමින්...

සුනාමියෙන් විපතට පත්වූ ජනතාව සඳහා නිවාස ඉදිකිරීමට දායක වන ලෙස කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා ව්‍යාපාරික ප්‍රජාවෙන් කරන ලද ඉල්ලීමකට අනුව දිවයිනේ දිස්ත්‍රික්ක තුනක සුනාමි ඛේදවාචකයට ලක්වූවන් වෙනුවෙන් නිවාස 150 ක් ඉදිකරදීමට කේ.පී.එම්.ජී. විගණන සමාගම ඉදිරිපත්ව සිටී.

දැනට එයින් නිවාස 50 ක් මාතර දිස්ත්‍රික්කයේ ඉදිවෙමින් පවතී. තවත් නිවාස 50 ක් යාපනයේ ඉදිකෙරෙනු ඇත. මේ ව්‍යාපෘතිය යටතේ නැගෙනහිර පළාතේ ගොඩනැගෙන නිවාස 50 ඉදිකිරීම් පසුගියදා ආරම්භවිය.

රුපියල් පන්ලක්ෂ පනස් දහසක් මෙම එක් නිවසක් සඳහා කේ.පී.එම්.ජී. සමාගම වැය කරයි. එක් නිවාස සංකීර්ණයක් සඳහා ඇමෙරිකානු ඩොලර් දස දහසක් වැය කරන බව එම සමාගම පවසයි.

මේ යටතේ නැගෙනහිර පළාතේ ඉදි කෙරෙන නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ ත්‍රිමලය කින්නියාව ප්‍රදේශයේය. ඒ සඳහා මුල්ගල තැබුවේ කේ.පී.එම්.ජී. සමාගමේ මෙරට අධ්‍යක්ෂ රාජන් ආශිර්වාදන් මහතාය. මේ අවස්ථාවට කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් වන මිලින්ද මොරගොඩ හා මොහොමඩ් මහරූෆ් යන මහත්වරුද ත්‍රිකුණාමල හිටපු මන්ත්‍රී එම්.ඒ.එම්. මහේෂ් මහතාද සහභාගි වූහ.